# කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත් කෘෂිකර්ම උපදේශක / පර්යේෂණ සහකාර / ඉංජිනේරු සහකාර / කාර්මික නිලධාරි/ පස් සමීක්ෂක තනතුරු දරණ නිලධාරින්ගේ වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය

## 01. හැඳින්වීම

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2009 පෙබරවාරි 20 වැනි සිකුරාදා දින නිකුත් කරන ලද අංක 1589/30 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළකරන ලද කාර්ය පටිපාටික රීති 1 කාණ්ඩයේ XVIII වන පරිච්ඡේදයේ 202 රීතියේ විධිවිධාන වලට අනුකූලව සැකසූ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කෘෂිකර්ම උපදේශක/ පර්යේෂණ සහකාර/ ඉංජිනේරු සහකාර/ කාර්මික නිලධාරි/ පස් සමීක්ෂක තනතුරු දරණ නිලධාරින් සඳහා මෙම වාර්ෂික ස්ථාන මාරු පටිපාටිය සකස් කරනු ලැබේ. ඒ අනුව කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ (මෙතෙක් බලපැවැත් වූ) තාක්ෂණ සේවා ගණවල තනතුරු දරණ නිලධාරින්ගේ ස්ථාන මාරු සම්බන්ධයෙන් වූ ස්ථාන මාරු පටිපාටි මෙයින් අවලංගු කරන අතර මෙම නව ස්ථාන මාරු පටිපාටිය අනුව ඉදිරියේ දී වාර්ෂික ස්ථාන මාරු සිදු කරනු ලබන බව මෙයින් දන්වමි.

## 02. වාර්ෂික ස්ථානමාරු සඳහා යටත් වන නිලධාරීන් පිළිබඳ විස්තර

2.1. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයට අයත්;

- කෘෂිකර්ම උපදේශක
- පර්යේෂණ සහකාර
- ඉංජිනේරු සහකාර
- පස් සමීක්ෂක
- කාර්මික නිලධාරි තනතුරු දරණ නිලධාරින්

2.2. සේවා ස්ථාන වර්ගීකරණය

2.2.1. ඉතා ප්‍රියමනාප සේවා ස්ථාන

ඉතා ප්‍රියමනාප සේවා ස්ථානය වශයෙන් සැලකිය යුත්තේ නිලධාරියා විසින් මුල්වරට කරන ප්‍රකාශය මඟින් දක්වන, තම පදිංචි දිස්ත්‍රික්කය/ ප්‍රදේශය සහ පහත සේවා ස්ථාන වේ.

i. ජාතික පැළෑටි නිරෝධායන සේවය, කටුනායක
ii. පැළෑටි නිරෝධායන ඒකකය, කොළඹ වරාය
iii. පැළෑටි නිරෝධායන ඒකකය, කටුනායක ගුවන්තොටුපල
iv. පැළෑටි නිරෝධායන ඒකකය, මත්තල ගුවන්තොටුපල
v. පැළෑටි නිරෝධායන ඒකකය, හම්බන්තොට වරාය

2.2.2. ප්‍රියමනාප සේවා ස්ථාන

ඒ සඳහා නිලධාරින්ගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කයට ආසන්නතම සේවා ස්ථානය පවතින දිස්ත්‍රික්කය හෝ ප්‍රදේශය ප්‍රිය මනාප දිස්ත්‍රික්කය හෝ ප්‍රදේශය ලෙස සලකනු ලැබේ.

2.2.3. පහත ස්ථානවල පිහිටා ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවා ස්ථාන ප්‍රියමනාප නොවන සේවා ස්ථාන වශයෙන් සලකනු ලැබේ.

- ඒ ඒ නිලධාරියා සම්බන්ධයෙන් අදාල ඉතිරි සියලුම සේවා ස්ථාන, ප්‍රියමනාප නොවූ සේවා ස්ථාන ලෙස සලකනු ලැබේ. ඒ ඒ නිලධාරියා සම්බන්ධයෙන් ඉතා ප්‍රියමනාප හෝ ප්‍රියමනාප නොවන පහත සඳහන් සේවා ස්ථාන දුෂ්කර සේවා ස්ථාන ලෙසද සලකනු ලැබේ.

| | | |
|---|---|---|
| රහංගල | බිබිල | කල්පිටිය |
| මහඉලුප්පල්ලම | පොළොන්නරුව | කන්තලේ |
| වවුනියාව | අම්පාර | නිකවැරටිය |
| අලුත්තරම | බටඅත | හම්බන්තොට |
| හසලක | අනුරාධපුරය | අරලගංවිල |

| | | |
|---|---|---|
| අඟුණකොලපැලැස්ස | ගිරාදුරුකෝට්ටේ | වනාතවිල්ලුව |
| මුතුකණ්ඩිය | වීරවිල | මීපිළිමාන |
| මොණරාගල | උඩරුදැල්ල | සීතාඑළිය |
| සමන්තුරේ | මුරුන්කන් | කරපිංච |
| මදුරුකැටිය | නුවරඑළිය | කරදියන්ආරු |
| තිරුනෙල්වේලි | පරන්තන් | |
| අම්බලන්තොට | | |

- පහත සදහන් දිස්ත්‍රික්ක වල ඇති සේවා ස්ථාන අති දුෂ්කර සේවා ස්ථාන ලෙසද සලකනු ලැබේ.

| | | |
|---|---|---|
| මුලතිව් | කිලිනොච්චිය | මන්නාරම |

## 03. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද කාර්ය පටිපාටික රීති 200 අනුව ස්ථාන මාරු මණ්ඩලයේ සංයුතිය පහත දැක්වේ.

i. අධ්‍යක්ෂ (ආයතන/ පාලන) - සභාපති
ii. අදාල අංශ භාර අධ්‍යක්ෂවරුන්ගෙන් තිදෙනෙක් - සමාජික
iii. සහකාර අධ්‍යක්ෂ (ආයතන ) / සහකාර අධ්‍යක්ෂ (පාලන) - සාමාජික
iv. තනතුරට අයත් සේවක සංඛ්‍යාවෙන් අවම වශයෙන් 15 % වත් සාමාජිකත්වය ලබා සිටින වෘත්තීය සමිතිවලින් එක් නියෝජිතයෙකු බැගින් - සාමාජික

## 04. වාර්ෂික ස්ථානමාරු යෝජනා සමාලෝචන කමිටුවේ සංයුතිය පිළිබඳ විස්තර

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු මාරු මණ්ඩලයට ඇතුළත් නොවූ ජ්‍යෝෂ්ඨ නිලධාරින් තිදෙනකු කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල් විසින් නම් කිරීමෙන්.

4.1. ස්ථාන මාරු යෝජනා වලට විරුද්ධව කෙරෙන අභියාචනා සළකා බැලීම සඳහා කාර්ය පටිපාටික රීතින්හි XV111 පරිච්ඡේදයේ 210 වගන්තිය අනුව වාර්ෂික ස්ථාන මාරු යෝජනා සඳහා මණ්ඩල පිහිටවනු ලැබේ. වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් ඉදිරිපත් කරනු ලබන අභියාචනා සළකා බලනු ලබන්නේ කාර්ය පටිපාටික රීතින්හි XV111 පරිච්ඡේදයේ 211 වගන්තිය අනුකූලව වේ නම් පමණි.

4.2. නිලධාරියෙකු ඉල්ලීමක් අනුව කරන ලද මාරුවීමක් අවලංගු කරන ලෙස හෝ කල් දමන ලෙසට පසුව අභියාචනා කිරීමට එම නිලධාරියාට හෝ ඒ පිළිබද නිර්දේශ ඉදිරිපත් කිරීමට ඒකක ප්‍රධානියාට/ අදාළ ඒකකය භාර අධ්‍යක්ෂට හෝ හිමිකම් නැත. ස්ථාන මාරු නියෝගයට විරුද්ධව කෙරෙන අභියාචනා සළකා බැලීම සඳහා වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු විසින් පහත සඳහන් කරුණු පිළිබද තවදුරටත් පරීක්ෂා කර තීරණ ගනු ඇත.

- ස්ථාන මාරුවීම් ප්‍රතිපත්ති යට අනුකුල නොවන පරිදි කරන ලද මාරුවීම්
- නිලධාරින්ගේ ඉල්ලීම් ඉටු නොවනු අවස්ථා ( මනාප අනුව 1, 2, 3 යන සේවා ස්ථාන ඉල්ලීම් ලෙස සලකනු ලැබේ.
- නිලධරයන්ගේ ඉල්ලීම් වලට පටහැනි ලෙස කරන ලද මාරු වීම්.
- ස්ථාන මාරුවීම් අයදුම් කරන ලද දිනයෙන් පසුව නිලධරයන්ට සිදු වූ හදිසි විපත්, කරදර, අසනීප වැනි සානුකම්පිත තත්වයන් පිළිබඳව පිළිගත හැකි නිර්දේශ ඉදිරිපත් කිරිම.
- වාර්ෂික ස්ථාන මාරු යෝජනා සමාලෝචන කමිටු තීරණ නිකුත් කළ පසු ඉදිරිපත් කරනු ලබන අභියාචනා කාර්ය පටිපාටික රීතින්හි XX වන පරිච්ඡේදයේ 230 වගන්තිය අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුය. සමාලෝචන කමිටුවට ඉදිරිපත් නොවූ අභියාචනා පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සළකා නොබලනු ඇත.

## 05. වාර්ෂික ස්ථාන මාරු ලබා දීමේ දී සැලකිල්ලට ගන්නා වෙනත් පොදු කරුණු.

5.1.

i. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම උපදේශක, පර්යේෂණ සහකාර, ඉංජිනේරු සහකාර, කාර්මික නිලධාරි, පස් සමීක්ෂක තනතුරු දරන නිලධාරින් වෙත පැවරි ඇති රාජකාරි හා අනුයුක්ත වී ඇති කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආයතන ස්ථානගත වී ඇති ආකාරය සැලකිල්ලට ගෙන සියලු නිලධාරින්ට සාධරණයක් ඉටු වන ආකාරයෙන් මෙම වාර්ෂික ස්ථාන මාරු ප්‍රතිපත්ති සකස් කර ඇත.

ii. මෙම වාර්ෂික ස්ථාන මාරු අදාල වර්ෂයේ ජනවාරි 01 වන දින සිට බල පැවැත්වෙන සේ ක්‍රියාත්මක විය යුතුය.

iii. සෑම නිලධාරියෙකුම ස්ථාන මාරු කිරිම් වලට යටත් වන අතර, දිවයිනේ කවර හෝ ප්‍රදේශයක සේවය කිරිමට යටත් වේ.

iv. වාර්ෂික ස්ථාන මාරුවීම් වලදී සේවා කාලය ගණනය කරනු ලබන්නේ ස්ථාන මාරු කරනු ලබන වර්ෂයට අදාල පෙර වර්ෂයේ දෙසැම්බර් 31 වන දිනට වේ ( උදා : 2020 වාර්ෂික ස්ථාන මාරු සඳහා 2019.12.31 දක්වා )

v. අදාල වර්ෂයේ ජුලි මස 01 දිනයත් දෙසැම්බර් 31 දිනයත් අතර කාලයේ සුහද ස්ථාන මාරු වීම් සඳහා ඉල්ලුම්පත්‍ර භාර නොගත යුතුය .

vi. වෘත්තීය සමිති නිලධාරීන්ගේ ස්ථාන මාරු සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXV පරිච්ඡේදයේ 07 වන ජේදය අදාල වේ.

vii. කවර හෝ නිශ්චිත ස්ථානයකට ස්ථාන මාරු අයදුම්පත් නොමැති විට, කවර හෝ නිලධාරියෙකු ස්ථාන මාරු කළ හැකි අතර, මාරු කිරිමට අවශ්‍ය අවස්ථාවලදී මෙම ස්ථාන මාරු පටිපාටියේ වගන්ති ද වෘත්තීය සමිති වල නිර්දේශය ද සලකා බලනු ලැබිය හැකිය. යම් සේවා ස්ථානයකට වැඩි අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කරන්නේ නම් පෙර සේවා ස්ථාන සැලකිල්ලට ගෙන ඒ අනුව ප්‍රමුඛත්වය ලබා දේ .

viii. ඉතා ප්‍රියමනාප, ප්‍රියමනාප, ප්‍රියමනාප නොවන වශයෙන් සේවා ස්ථාන වර්ග කරනු ලැබේ. ප්‍රියමනාප නොවු ප්‍රදේශ තව දුරටත් දුෂ්කර හා අති දුෂ්කර සේවා ස්ථාන ලෙස වර්ග කරනු ලැබේ.

ix. ඉතා ප්‍රියමනාප/ ප්‍රියමනාප සේවා ස්ථානයක වසර 05 ක් අඛණ්ඩව සේවය කළ නිලධාරින් වාර්ෂික ස්ථාන මාරු කිරිම් වලට යටත් වන අතර, ප්‍රියමනාප නොවු සේවා ස්ථානයක අවම වශයෙන් අවුරුදු 02 ක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරින් ස්ථාන මාරු වීම් ඉල්ලා සිටිම සඳහා සුදුසුකම් ලබති. තව ද සුදුසුකම් ලබන වෙනත් නිලධාරින් විසින් ඉදිරිපත් කරන ස්ථාන මාරු අයදුම්පතකට ඉඩ සැලසීම සඳහා පමණක් පරිවාස නිලධාරින්ගේ ස්ථාන මාරු අයදුම්පත් සලකා බලනු ලැබේ.

x. අයදුම්කරුවෙකුගේ සේවා ස්ථානයක කාලය ගණන් ගැනීමේ දි අයදුම්කරු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විවිධ තනතුරු යටතේ එක් එක් සේවා ස්ථානයන්හි සිටි සේවා කාලය ද, ඒ ඒ සේවා ස්ථානයන්හි මුළු සේවා කාලයට එකතු කොට ගණන් ගනු ලැබේ.

xi. ඉතා ප්‍රියමනාප/ ප්‍රියමනාප සේවා ස්ථාන වල සේවය කරන නිලධාරින් විසින් නැවත ඉතා ප්‍රියමනාප/ ප්‍රියමනාප සේවා ස්ථානයකට කරනු ලබන ස්ථානමාරු ඉල්ලීම් සලකා බලනු ලබන්නේ එම සේවා ස්ථානවලට ප්‍රියමනාප නොවන සේවා ස්ථාන වල සේවය කරන නිලධාරින් විසින් කරනු ලබන ඉල්ලීම් සලකා බැලීමෙන් පසුවය.

xii. යම් නිලධාරියෙකු වාර්ෂික ස්ථාන මාරුවීම් ඉල්ලුම් කිරිමේ දී ඔහු/ඇය විසින් ඉතා ප්‍රියමනාප/ ප්‍රියමනාප ලෙස සඳහන් කර ඇති දිස්ත්‍රික්ක වල මීට පෙර සේවය කර ඇති සේවා ස්ථාන හැර වෙනත් සේවා ස්ථානවලට ඉල්ලුම් කරන්නේ නම්, ඔවුන්ගේ අයදුම්පත්

සලකා බලනුයේ සුදුසුකම් ලබන වෙනත් නිලධාරියෙකුගේ අයදුම්පතකට ඉඩ සැලසීමට එම ස්ථාන මාරුව ලබා දීමෙන් හැකිවන්නේ නම් පමණි. කෙසේ වුවද, මුල්වරට කරනු ලැබූ ප්‍රකාශය වෙනස් කිරිමට යම් නිලධාරියෙකුට අවශ්‍යතාවයක් තිබේ නම් ඒ සඳහා පිළිගත හැකි සාධාරණ හේතු ඉදිරිපත් කර නැවත ප්‍රකාශයක් ඉදිරිපත් කළ හැක.

xiii. යම් නිලධාරියෙකු ඉතා ප්‍රියමනාප/ ප්‍රියමනාපය වෙනස් කිරිමක් සිදු කර තිබෙන අවස්ථාවක එකී වෙනස් කිරිම පදනම් කර ගෙන මාරුවීම් සලකා බැලීමේදී වෙනස් කිරිමට පෙර ඔහු /ඇය සේවය කර තිබූ ඉතා ප්‍රියමනාප, ප්‍රියමනාප සහ ප්‍රියමනාප නොවූ සේවා ස්ථානයද ඇගයීම් කිරිම සඳහා සලකා බලනු ලැබේ.

xiv. එක් අධ්‍යක්ෂ අංශයක වසර 10 කට වැඩි කාලයක් සේවය කරන ලද නිලධාරීන් එම අධ්‍යක්ෂ අංශයෙන් පිටතට හා එක් සේවා ස්ථානයක වසර 05 කට වැඩි සේවා කාලයක් ඇති නිලධාරින් වෙනත් සේවා ස්ථානයක් වෙත ද ස්ථාන මාරු කිරිමට කටයුතු කරනු ලැබේ.

xv. යම් සේවා ස්ථානයකට මාරුවීම් ඉල්ලීම් කර ඇති නිලධාරින් සංඛ්‍යාවට වඩා, උපරිම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරින් සංඛ්‍යාවක් එම සේවා ස්ථානයේ සිටින විට, එකී නිලධාරින්ගෙන් එම සේවා ස්ථානයේ අඛණ්ඩව වැඩිම සේවා කාලයක් සේවය කර ඇති නිලධාරින්ට ප්‍රමුඛතාවය ලැබෙන පරිදි මාරු කිරිමට යටත් කරනු ලැබේ. එසේ වුව ද එකම සේවා කාලය සම්පූර්ණ කරන ලද නිලධාරින් කීපදෙනෙකු සිටී නම් ඉතා ප්‍රියමනාප හා ප්‍රියමනාප සේවා ස්ථානවල වැඩිම සේවා කාලයක් සේවය කර ඇති නිලධාරින් පළමුවෙන්ම ස්ථාන මාරු කිරිමට යටත් කරනු ලැබේ.

xvi. අනෙකුත් වගන්තිවල කෙසේ සඳහන් වුව ද වයස අවු: 57 ක් ඉක්මවූ නිලධාරියෙකු ඔහුගේ කැමැත්තකින් තොරව ඔහුගේ ගම්පළාත වන දිස්ත්‍රික්කයකින් පිටතට ස්ථාන මාරු නොකෙරේ .

xvii. වාර්ෂික ස්ථාන මාරු සඳහා අයදුම් කිරිම ස්ථාන මාරුවලට යටත් වන නිලධාරින්ගේ වගකීමක් වන අතර නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති නමුත් එසේ අයදුම් නොකරන නිලධාරින් ස්ථාන මාරු මණ්ඩලයේ අභිමතය පරිදි පුරප්පාඩු ඇති සේවා ස්ථාන වෙතට ස්ථාන මාරු කිරිමට යටත්වේ. (මෙසේ අයදුම් නොකරන නිලධාරින් ඕනෑම සේවා ස්ථානයක සේවය කිරිමට කැමැති නිලධාරින් ලෙස සලකා කටයුතු කරනු ලැබේ.)

xviii. සාවද්‍ය තොරතුරු සැපයීම හා සාවද්‍ය ප්‍රකාශ මත ස්ථාන මාරු අයදුම් කළ නිලධාරින්ට එරෙහිව විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

xix. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය වෙත අදාළ ලියකියවිලි අදාල වර්ෂයේ ජුලි 31 දිනට පෙර ඒකක ප්‍රධානී / අධ්‍යක්ෂ මඟින් ඉදිරිපත් කිරිමට ස්ථාන මාරුවීම් ඉල්ලුම් කරනු ලබන නිලධාරින් ක්‍රියා කළ යුතුය.

5.2. ස්ථාන මාරු මණ්ඩලයට යටත් නොවන ස්ථාන මාරු කිරිම්.

i. සේවා අවශ්‍යතාව මත කරන ස්ථාන මාරු වීම්
ii. විනය නියෝගයක හෝ විනයානුකූලව ක්‍රියාමාර්ග අවශ්‍යතාවය මත හෝ විනය හේතු මත කරන ස්ථාන මාරු කිරිම්
iii. නිලධාරියාගේ ඉල්ලීම් මත කරන සුහද ස්ථාන මාරු කිරිම්
iv. සේවා ස්ථානයේ වෙනසක් නොවන අභ්‍යන්තර මාරු කිරිම්
v. සේවා අවශ්‍යතාවය මත රඳවා ගැනිම්

5.3. ස්ථාන මාරු ලැබීම් සඳහා සේවා ස්ථානයක සේවයේ නියුක්ත විය යුතු කාල සීමාව.

i. ඉතා ප්‍රියමනාප / ප්‍රියමනාප සේවා ස්ථානයක වසර 05 ක් අඛණ්ඩව සේවා කරන ලද නිලධාරින්
ii. ප්‍රියමනාප නොවන සේවා ස්ථානයක අවම වසර 02 කි. (ස්ථාන මාරු ඉල්ලීමට සුදුසුකම් ලබයි)
iii. එක් සේවා ස්ථානයක සේවය එක්වරක දී වසර 05 කට සීමා වේ.
iv. මුළු සේවා කාලය තුළ අවස්ථා 02 ක් ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක සේවය කිරිමට අවස්ථා ලබා දේ.

v. එක් අධ්‍යක්ෂ අංශයක වසර 10 කට වැඩි කාලයක් සේවය කරන ලද හා එක් ඒකකයක වසර 05 කට වැඩි කාලයක් සේවය කරනු ලබන නිලධාරින් අනිවාර්යයෙන් අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.

vi. ඉතා ප්‍රියමනාප සේවා ස්ථානයක වසර 05 ක් සේවය කර ඇති නිලධාරින් අනිවාර්යයෙන්ම ස්ථාන මාරු සඳහා යටත් වන්නේය.

5.4. මාරු කිරීම සඳහා වු ලකුණු දීමේ ක්‍රමය

| | | |
|---|---|---|
| i. සේවා කාලය | (අ) | රජයේ සේවා කාලය සඳහා (ජ්‍යෙෂ්ඨ හා වැඩි කාලයක් සේවය කරන නිලධාරින්ට අවස්ථාව සැලසීම සඳහා) (වසරකට ලකුණු 01 බැගින් උපරිම ලකුණු 30) |
| | (ආ) | ප්‍රිය මනාප නොවු සේවා ස්ථාන වල සේවා කාලය සඳහා වසරකට ලකුණු 02 බැගින්ද, දුෂ්කර සේවා ස්ථානවල සේවා කාලය සඳහා වසරකට ලකුණු 04 බැගින්ද, අති දුෂ්කර සේවා ස්ථාන වල සේවා කාලය සඳහා වසරකට ලකුණු 08 බැගින්ද ලකුණු එකතු කරනු ලැබේ. |
| | (ඇ) | ඉතා ප්‍රියමනාප සේවා ස්ථාන වල කර ඇති සේවය සඳහා වසරකට ලකුණු 02 බැගින්ද, ප්‍රියමනාප ස්ථාන වල කර ඇති සේවය සඳහා වසරකට ලකුණු 01 බැගින්ද අඩු කරනු ලැබේ. |
| ii. සිවිල් තත්ත්වය | | විවාහක නිලධාරින්ට/ අවිවාහක නිලධාරින්ට (අවු 50 ට වැඩි - ලකුණු 20 බැගින්) |
| iii. දරුවන් සඳහා | | අවිවාහක සහ රැකියා නොකරන අවුරුදු 21 ට අඩු දරුවන් සඳහා එක් දරුවෙකුට (ලකුණු 05 බැගින් උපරිම ලකුණු 20) |
| iv. මාරු මණ්ඩලය පිළිගතහැකි වෙනත් පෞද්ගලික හේතු | | එක් කරුණකට (ලකුණු 05 බැගින් උපරිම ලකුණු 20) |

<u>මාරු මණ්ඩලය පිළිගත හැකි වෙනත් පෞද්ගලික හේතු</u>

i. නිලධාරියා සම්බන්ධයෙන් වු සෞඛ්‍ය හේතූන් මත (පිළිගත හැකි වෛද්‍ය සහතික ඉදිරිපත් කළ යුතුය.)
ii. නිලධාරියා ගේ /කලත්‍රයාගේ දෙමව්පියන් රැක බලා ගැනීම. (ග්‍රාම නිලධාරි සහතිකයක් මගින් ඉදිරිපත් කල යුතුය.)
iii. නිලධාරියාගේ වැඩිදුර අධ්‍යයන කටයුතු (පිළිගත හැකි තොරුතුරු ඉදිරිපත් කළ යුතුය)
iv. දරුවන්ගේ විශේෂ රෝගී තත්ත්වයක් සඳහා (පිළිගත හැකි වෛද්‍ය සහතික සමග තොරතුරු ඉදිරිපත් කළ යුතුය)
v. නිලධාරියා සම්බන්ධයෙන් හදිසියේ ඇති වු විපතක් / ආපදාවක් සඳහා (ස්වාභාවික විපත්, කලත්‍රයා වියෝවීම/ ආබාධ වීම වැනි)
vi. අවුරුදු 02 කට අඩු දරුවන් සිටීම.
vii. වෙනත් පිළිගත හැකි හේතූන්

v. විශේෂහේතු :-

(අ) අවුරුදු 45 සම්පූර්ණ කළ නිලධාරියෙකුට තම සේවා කාලය තුල ඔහුගේ /ඇයගේ ගම් ප්‍රදේශයේ සේවය කිරිමට අවස්ථාව ලැබී නොමැති නම් - ලකුණු 10

(ආ) වයස අවුරුදු 57 ඉක්ම වු නිලධාරින් - ලකුණු 15

vi. ප්‍රදේශයක සිට පිටතට මාරු ලබා තිබුනු නිලධාරින් යලිත් එම ප්‍රදේශයට මාරුවීමක් ඉල්ලීමේදී වසර 01 පසු අවුරුදු 09 ක් දක්වා පහත පරිදි ලකුණු අඩු කරනු ලැබේ.

| | |
|---|---|
| වර්ෂ 1 – 2 අතර | - ලකුණු 60 |
| වර්ෂ 2 – 3 අතර | - ලකුණු 50 |
| වර්ෂ 3 – 4 අතර | - ලකුණු 40 |
| වර්ෂ 4 - 5 අතර | - ලකුණු 30 |
| වර්ෂ 5 – 6 අතර | - ලකුණු 20 |
| වර්ෂ 6 – 7 අතර | - ලකුණු 15 |
| වර්ෂ 7 - 8 අතර | - ලකුණු 10 |
| වර්ෂ 8 - 9 අතර | - ලකුණු 05 |

vii. සම ලකුණු ලැබූ අවස්ථාවල ඉහත i (අ) සහ (ආ) සඳහා සේවය කර ඇති වර්ෂයකට අඩු කාලයද පදනම් කරගෙන ලකුණු ප්‍රමාණයක් එකතු කිරීමෙන් පසුව වඩාත් සුදුසු අයදුම්කරු තෝරාගනු ලැබේ.

5.5 ස්ථාන මාරු අයදුම්පත්‍ර :

වාර්ෂික ස්ථාන මාරු වීම් සඳහා එවනු ලබන අයදුම්පත්‍ර ඇමුණුම 1 හි සඳහන් ආකෘති පත්‍රය අනුව සකස් කර තම ඒකක ප්‍රධානියාගේ හා අදාල අධ්‍යක්ෂගේ නිර්දේශය සහිතව ඉදිරිපත් කළ යුතුය. තවද එක් නිලධාරියෙකු එක් අයදුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ යුතය. අයදුම්පත් ඉදිරිපත් කිරිමේදී ඒ සඳහා සකස් කර හඳුන්වා දෙනු ලබන ආදර්ශ ආකෘති පත්‍රයට අනුවම සකස් කළ අයදුම්පත් පමණක් ඉදිරිපත් කළ යුතු වේ.

ස්ථාන මාරුවීම් අයදුම් කරන නිලධාරීන් කිසියම් නිශ්චිත සේවා ස්ථානයකට පමණක්ම ස්ථාන මාරු වී යාමට අපේක්ෂා කරන්නේ නම් අදාළ සේවා ස්ථානය සහ අදාළ අධ්‍යක්ෂ අංශය යන දෙකම සඳහන් කිරිම සුදුසුය. තමන් ස්ථාන මාරු වී යාමට අපේක්ෂා කරන්නේ කිසියම් දිස්ත්‍රික්කයකට / ප්‍රදේශයකට යාමේ අවශ්‍යතාවය මත ද නැතහොත් තමන් කැමැති ඒකකයකට යාමට උවමනාවෙන් ද යන්න අයදුම්පතේ සඳහන් කිරිම සුදුසුය. ඒ අනුව තමන්ගේ මනාපය අනුපිළිවෙලින් දැක්වෙන පරිදි ප්‍රදේශ හෝ කාර්යාලය නම් කළ යුතු වේ.

5.6 වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධයෙන් ඒකක ප්‍රධානින්ගේ / අධ්‍යක්ෂගේ වගකීම:

i. ස්ථාන මාරුවීම් ලැබීමට ඉඩ ඇතැයි සිතන කිසියම් නිලධරයෙකු සේවා අවශ්‍යතාවය මත තවත් වර්ෂයක තම ශාඛාව/ අංශය තුළ රඳවා ගත යුතු යැයි ඒකක ප්‍රධානියා හෝ අදාළ අධ්‍යක්ෂ අදහස් කරන්නේ නම්, නිර්දේශිත අයදුම්පත්‍ර යොමු කරන අවස්ථාවේදීම ඒ පිළිබඳව පිළිගත හැකි හේතු සඳහන් කර ඒකක ප්‍රධනීන්ගේ නිර්දේශ ඇතිව අධ්‍යක්ෂ (ආයතන) වෙත තම ඉල්ලීම ඉදිරිපත් කළ යුතුවේ. අධ්‍යක්ෂ (ආයතන) විසින් මාරු කමිටුවට ඒ පිළිබඳව දැනුම් දී ක්‍රියා කරනු ඇත. එක් වතාවකදී මෙම අවස්ථාව ලබාදී ඇති නිලධරයෙකු සඳහා නැවත අවස්ථාවක් ලබා දෙනු නොලැබේ.

ii. සෑම නිලධරයන් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට ඒකක ප්‍රධානීන් / අදාළ අධ්‍යක්ෂ වගබලා ගත යුතුය. සාවද්‍ය අසම්පූර්ණ තොරතුරු සපයා ඇති බව හෙලිවුවහොත් ඒ පිළිබඳව ඒකක ප්‍රධානින් / අදාළ අධ්‍යක්ෂ හා එම ලැයිස්තු සකස් කළ හා හරි වැරදි බලන ලද නිලධරයන් වගකීමට බැඳී සිටින අතර සාවද්‍ය කරුණු ඉදිරිපත් කිරිම සම්බන්ධව විනය ක්‍රියාමාර්ග ගනු ලැබේ.

iii. වාර්ෂික ස්ථාන මාරු නියෝග මඟින් ස්ථාන මාරුවීම් ලබාදී ඇති නිලධරයන් අනුප්‍රාප්තිකයන් පැමිණෙන තෙක් රඳවා නොගෙන නියමිත දින නව සේවා ස්ථානයේ රාජකාරි භාර ගැනීමට හැකි වන සේ ඔවුන් මුදා හැරීමට කටයුතු කළ යුතුය. මෙම විධිවිධාන වලට පටහැනිව කටයුතු කරන ඒකක ප්‍රධානින් සම්බන්ධයෙන් විනයානුකූලව කටයුතු කරනු ලැබේ.

iv. ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් කාර්ය පටිපාටික රීති (කාණ්ඩ අංක 01) හා 11 වගන්තියේ විධිවිධාන වලටද නිලධරයන්ගේ අවධානය යොමු කරවිය යුතුවේ.

v. ස්ථාන මාරුවීම් ලැබේ යැයි අපේක්ෂා කරන නිලධරයන්ගේ රාජකාරි කටයුතු කල් ඇතිව නිලධරයන් පුහුණු කර වාර්ෂික ස්ථාන මාරුවීම් නියමිත දිනට ක්‍රියාත්මක කරවීමට ඒකක ප්‍රධානින් විසින් කටයුතු කළ යුතුය. මෙවැනි කරුණු සම්බන්ධයෙන් පසුව කෙරෙන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

vi. මෙම ස්ථානමාරු පටිපාටියේ සඳහන් විධිවිධාන ඔබගේ ඒකකයේ / අදාල අංශයේ සියළුම නිලධරයන් වෙත දැන ගැනීමට සැලැස්විය යුතුය.

vii. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතීන්හි 214, 215, 216, 217 වගන්ති වල සඳහන් විධිවිධාන බලපැවැත්වෙනු ඇත.

5.7 නිලධාරීන්ගේ වගකීම්:

වාර්ෂික ස්ථාන මාරු නියෝගයක් ලැබූ සියලුම නිලධරයෝ නියමිත දිනයේදී නව රාජකාරී ස්ථානය වෙත සේවය සඳහා වාර්තා කිරීමට බැඳී සිටිති.

i. මෙම ස්ථාන මාරු පටිපාටියේ දක්වා නොමැති විධි විධාන සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.
ii. මෙම ස්ථාන මාරු පටිපාටිය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පටිපාටික රීති (කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ජේදයේ 202 වගන්තිය අනුව නිකුත් කරනු ලැබේ.

## 06. <u>වාර්ෂික ස්ථාන මාරු කාල සටහන</u>

| අනු අංකය | කාරණය | දින වකවානු |
|---|---|---|
| 01. | ස්ථාන මාරු මණ්ඩල පත් කිරීම | ජුනි 30 ට පෙර |
| 02. | අයදුම්පත් කැඳවීම | ජුනි 30 ට පෙර |
| 03. | නිලධාරින් විසින් අයදුම්පත් ඉදිරිපත් කිරීම | ජූලි 31 ට පෙර |
| 04. | කමිටු නිර්දේශ ලබා ගැනීම | අගෝස්තු 15 ට පෙර |
| 05. | කමිටු නිර්දේශ සඳහා කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගැනීම | අගෝස්තු 31 ට පෙර |
| 06. | යෝජිත ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම | සැත්තැම්බර් 30 ට පෙර |
| 07. | සමාලෝචන කමිටු පත් කිරීම/ අභියාචනා භාර ගැනීම | ඔක්තෝබර් 01 ට පෙර |
| 08. | සමාලෝචන කමිටු විසින් අභියාචනා පරීක්ෂා කිරීම | ඔක්තෝම්බර් 15 ට පෙර |
| 09. | සමාලෝචන තීරණ සඳහා කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය ලබා ගැනීම | ඔක්තෝම්බර් 31 ට පෙර |
| 10. | ස්ථාන මාරු නියෝග නිකුත් කිරීම | නොවැම්බර් 01 ට පෙර |
| 11. | ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම | ජනවාරි 01 |

## 07. <u>වාර්ෂික ස්ථාන මාරු නියෝග වලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීම පිළිබඳ විස්තර</u>

7.1 ස්ථාන මාරු කිරීමක් පිළිබඳව දෙන ලද නියෝගයකට එරෙහිව කිසියම් රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කරන්නේ නම්, එම අභියාචනය ආකෘති පත්‍ර ඇමුණුම 03 ( 3a හා 3b) ප්‍රකාරව පමණක් ඉදිරිපත් කළයුතු වන්නේය. තවද, තමන් විසින්

ඉදිරිපත් කරනු ලබන කරුණු තහවුරු කිරීමට අදාළ ලියවිලි වල සහතික කල පිටපත් එම අභියාචනය සමඟ ඉදිරිපත් කිරීමට ද, ඔහු ක්‍රියා කළ යුතු වන්නේය.

7.2 රජයේ නිලධරයෙකු විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත අභියාචනයක් ඉදිරිපත් කළ යුතු වන්නේ, විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්ය. තමන් වෙත ඉදිරිපත් වන අභියාචනය අප්‍රමාදවම තම නිරීක්ෂණ සහිතව රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කිරීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ (ඇමුණුම 03 හි ඇති ආකෘතිය අනුව) වගකීම වන්නේය. නිලධරයා තම කැමැත්ත පරිදි, අභියාචනයේ ප්‍රගමන පිටපතක් සෘජුවම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ හැක්කේය.

7.3 ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව ඉදිරිපත් කරණු ලබන අභියාචනයක්, එම ස්ථාන මාරු කිරීමේ නියෝගය අදාළ රජයේ නිලධරයා වෙත ලද දින සිට දින 14 ක් ඇතුලත ඉදිරිපත් කළ යුතු වන්නේය. නියමිත කාලය තුළ දී නොවන අභියාචනා රාජ්‍ය සේවා කොමිෂන් සභාන විසින් ප්‍රතික්ෂේප කරනු ලබන්නේය.

7.4 කොමිෂන් සභාව වෙත යොමු කිරීම සඳහා නිලධරයෙකු විසින් භාර දෙනු ලබන අභියාචනය අදාළ සියලු ලිපිගොනු, ලිපි ලේඛන හා වාර්තා ආදිය ද, ඊට අදාළ තම නිරීක්ෂණ ද, නිර්දේශද සහිතව එම අභියාචනය ලැබී දින 15 ක් ඇතුලත රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ඉදිරිපත් කිරීමට අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හා විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා වග බලාගත යුතු වන්නේය. එතකුදු වුවත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති සංග්‍රහයේ XVIII පරිච්ඡේදයේ සඳහන් වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව අභියාචනා අදාළ ලිපිගොනු, ලිපිලේඛන, නිරීක්ෂණ හා නිර්දේශ සමඟ නොවැම්බර් 15 දිනට ප්‍රථම රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතු වන්නේය.

7.5 මෙම පරිච්ඡේදයේ සඳහන් නියමයන්ට අනුගතව තම ඉදිරිපත් කිරීම සෑම රජයේ නිලධාරියෙකුගේම වගකීම වන අතර, ඊට පටහැනිව ඉදිරිපත් කරනු ලබන අභියාචනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සලකා බලනු නොලබන්නේය.

7.6 ඉහත 7.4 වගන්තියේ සඳහන් ලියවිලි ලැබී දින 15 ක් ඇතුළත, ස්ථාන මාරු කිරීමේ නියෝගයකට එරෙහිව රජයේ නිලධරයෙකු විසින් ඉදිරිපත් කර ඇති අභියාචනා සම්බන්ධයෙන් තීරණයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබයි.

7.7 ඉහත සඳහන් පරිදි ඉදිරිපත් කර ඇති අභියාචනයක් සම්බන්ධයෙන් වන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය සෘජුවම අභියාචක වෙත දන්වනු ලබන අතර, එහි පිටපතක් අදාළ පරිදි විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් හා දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත යවනු ලබන්නේය.

7.8 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගයකින් හෝ තීරණයක් හෝ අතෘප්තියට පත් වන රජයේ නිලධාරියෙකුට 2002 අංක 04 දරණ පරිපාලන අභියාචනා විනිශ්වය අධිකාරිය පනතේ සඳහන් විධිවිධාන වලට අනුකූලව පරිපාලන අභියාචනා විනිශ්වය අධිකාරිය වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට හිමිකම් ඇත්තේය.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ආචාර්ය ඩබ්.එම්.ඩබ්. වීරකෝන්
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්

දිනය :2020.06.12

ආචාර්ය ඩබ්.එම්.ඩබ්. වීරකෝන්
කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්
කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
පේරාදෙණිය.